සැකසුම - කේ.කේ.කේ.පොල්වත්ත (නක්කාවිට ක.වි)
දැරණියගල කොට්ඨාසය

**පාඩම/ඒකකය - 7.2.3. දෙගල්දොරුව රජ මහා විහාරය**

1. ඉගෙනුම් අත්වැල

- කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා (ක්‍රි.ව. 1747 - 1782) විසින් මෙම ලෙන් විහාරය ගොඩනගන ලදී.
- දෙවරගම්පල සිල්වත්තැන මෙහි සිතුවම් ඇඳ ඇති අතර, කොස්වත්තේ සිත්තර නයිදේ හා නීලගම පටබැන්දා මොහුට සහාය වී ඇති බව පොත පතෙහි සඳහන් වේ.
- ගර්භගෘහයට ඇතුළුවන දොරටුව දෙපස ඇති තීරු චිත්‍ර සංරචන අතර වෙස්සන්තර ජාතකය හා සුතසෝම ජාතකය සුවිශේෂී නිර්මාණ වශයෙන් දැක්වේ.
- විශේෂයෙන් වෙස්සන්තර ජාතක කතාව තුළ ගැබ් ව ඇති ඇලි ඇතු දන්දීම දැක්වෙන චිත්‍රය විශිෂ්ට නිර්මාණයක් වශයෙන් සැලකේ. ඇතුන්ගේ සජීවී චලනය හා රිද්මය නිරූපණය ඊට හේතු වේ.
- සිතුවම් නිර්මාණ ආශ්‍රිත දැකිය හැකි ප්‍රධාන ලක්ෂණ ලෙස තීරු චිත්‍ර සංරචනවල අඛණ්ඩ කථන ක්‍රමය, පාර්ශව දර්ශී රූප හා ද්විමාන ලක්ෂණ සහිත පැතලි වර්ණ භාවිතය, පසුබිම සඳහා අඳුරු රතු වර්ණය භාවිතය, වර්ණ සඳහා කහ, කොළ, රතු, කළු, සුදු ආදී වර්ණ භාවිතය, ප්‍රෙස්කෝ සිකෝ හෙවත් වියළි බදාම මත සිතුවම් ඇඳීමේ ශිල්ප ක්‍රමය රූප වටා නිමාව දක්වන ප්‍රශස්ත මට්ටමින් යුතු සියුම් රේඛාකරණය හා පසුබිම අවකාශය පිරවීම සඳහා විවිධ සැරසිලි මෝස්තර භාවිතය ගත හැකිය.
- විහාර වියන් තලයේ විශාල චිත්‍ර සංරචනයක් ලෙස නිරූපණය කර ඇති මාර පරාජය සිතුවම සුවිශේෂී සමාජ ප්‍රකාශනයක් සහිත නිර්මාණයක් වශයෙන් සැලකේ.


දෙගල්දොරුව රජ මහා විහාරය


වෙස්සන්තර රජු අලි ඇතුන් දන් දීම


මාර පරාජය

2. ක්‍රියාකාරකම

හිස්තැන් පුරවන්න

1) දෙගල්දොරුව රජ මහා විහාරය ...................................... විසින් නිර්මාණය කර ඇත.

2) විශාල චිත්‍ර සංරචනයක් ලෙස .................................. සිතුවම විහාර වියන් තලයේ දක්නට ඇත.

3) මෙම විහාරය ....................................... විහාර වර්ගයට අයත් වේ.

4) ගර්භගෘහයට ඇතුළුවන දොරටුව දෙපස ඇති තීරු චිත්‍ර සංරචන අතර ............................... සිතුවම හා .............................. සිතුවම දක්නට ඇත.

5) මෙම විහාරයේ දක්නට ලැබෙන සුවිශේෂී සිතුවම් නම් කරමින් ඒවා පිළිබඳ ඇගයීමක් කරන්න

3. ඇගයීම

පහත ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න

01) දෙගල්දොරුව විහාරයේ සිතුවම් නම් කරන්න

02) දෙගල්දොරුව විහාරයේ ඓතිහාසික පසුබිම කෙටියෙන් පැහැදිලි කරන්න.

- යුගය/ කාලය
- අනුග්‍රහය
- ශිල්පියා

03) දෙගල්දොරුව විහාර සිතුවම් අතර දක්නට ලැබෙන සුවිශේෂී සිතුවම් නම් කරමින් ඒවා පිළිබඳ ඇගයීමක් කරන්න.

- ශෛලිය
- ශිල්ප ක්‍රමය
- වර්ණ භාවිතය
- රේඛාකරණය
- භාව ප්‍රකාශන